# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2256/25 - 2021 නොවැම්බර් මස 30 වැනි අඟහරුවාදා - 2021.11.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත යටතේ දැන්වීම්

**(262 අධිකාරය) පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කල්මුණේ මහ නගර සභාවේ සභික ධුරයේ පුරප්පාඩුවක් පිරවීම**

අවසර නොලබා සභාවේ අනුගාමී සාමාන්‍ය රැස්වීම් තුනකට සහභාගී නොවීම හේතුකොට ගෙන කල්මුණේ මහ නගර සභාවේ සභිකයෙකුගේ ධුරයක් පුරප්පාඩු වී ඇති හෙයින් ද;

ඉහත කී ආඥාපනතේ 66අ(1)(අ) වගන්තිය යටතේ කල්මුණේ මහ නගර සභාවේ අංක 19 - කොට්ඨාස 19 කොට්ඨාසයට තේරී පත් වූ මහරන් වසීර් අයත් වන්නා වූ ස්වාධීන කණ්ඩායම් 04 කණ්ඩායම් නායකයාට දින තිහ (30)ක කාල පරිච්ඡේදය ඇතුළත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය), 9 වගන්තිය යටතේ නුසුදුස්සෙකු වී නොමැති අපේක්ෂකයකු සභිකයෙකු වශයෙන් තෝරාපත් කර ගනු ලැබිය යුතුයැයි ප්‍රකාශ කරනු ලැබිය යුතු වූද, එම ස්වාධීන කණ්ඩායමට අයත් වන්නාවූ ද, එම කල්මුණේ මහ නගර සභාවේ අංක 19 කොට්ඨාස 19 කොට්ඨාසයේ සභිකයා පිළිබඳව තීරණය කිරීමට මා විසින් නියම කරනු ලැබ ඇති හෙයින් ද;

ඉහත කී ස්වාධීන කණ්ඩායමේ කණ්ඩායම් නායකයා විසින් එම පුරප්පාඩුව පිරවීම සඳහා සාලීන් මෞපියා නම් කිරීමේ ස්වකීය තීරණය දන්වනු ලැබ ඇති හෙයින් ද;

කල්මුණේ මහ නගර සභාවේ තේරීම්භාර නිලධාරි මුහෙයියදීන් බාවා මුහම්මදු සුෆ්යාන් වන මම, පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ (262 අධිකාරය) 66අ(1)(අ) වගන්තිය ප්‍රකාර ක්‍රියාකරමින් සාලීන් මෞපියා කල්මුණේ මහ නගර සභාවේ අංක 19 - කොට්ඨාස 19 කොට්ඨාසයේ සභිකයා වශයෙන් තෝරාපත් කර ගත් බව මෙයින් ප්‍රකාශ කරමි.

**එම්. බී. එම්. සුෆ්යාන්,**
තේරීම්භාර නිලධාරි,
කල්මුණේ මහ නගර සභාව.

2021 නොවැම්බර් මස 29 වැනි දින,
දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලය,
අම්පාර.

12 - 306

1A - G 35471 - 20 (2021/11)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.